ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ: රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
දිනය: 2015 ඔක්තෝබර් 28

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එක්සත් ජනපද ඩොලර් මිලියන 1,500ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංකාව) වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව වසර 10ක පරිණත කාලයක් සහිත එක්සත් ජනපද ඩොලර් මිලියන 1,500ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඵලදා අනුපාතිකය වාර්ෂික ව සියයට 6.850ක් යටතේ 2015 ඔක්තෝබර් 27 වන දින සාර්ථක ලෙස නිකුත් කරන්නට යෙදිණි.

මෙය ශ්‍රී ලංකාව විසින් නිකුත් කරන ලද නව වන එක්සත් ජනපද ඩොලර් ස්වෛරීත්ව බැඳුම්කරය වන අතර ම 2007 වසරේ සිට මේ දක්වා නිකුත් කරන ලද ඉහළ ම වටිනාකම සහිත බැඳුම්කරය ද වේ.

ෆිච් රේටින්ග්ස්, මූඩීස් ඉන්වෙස්ටර්ස් සර්විස් සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් යන ශ්‍රේණිගත කිරීම් ආයතන විසින් මෙම නිකුතුව පිළිවෙළින් ‘BB-’, ‘B1’ සහ ‘B+’ ලෙස ශ්‍රේණිගත කරන ලදී. මෙම ගනුදෙනුවේ දී සිටි ගෲප්, ඩොයිෂ් බැන්ක්, ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් සහ ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැන්ක් යන ආයතන ඒකාබද්ධ නියමු කළමනාකරුවන්/ඒකාබද්ධ ගනුදෙනු පවත්වන්නන් ලෙස කටයුතු කළහ.

ඇණවුම් ලැබීම අවසානයේ දී 2.2 වාරයක අධි දායකත්ව අනුපාතයක් සහිත ව, එක්සත් ජනපද ඩොලර් බිලියන 3.3ක ඇණවුම් ප්‍රමාණයක් ආයෝජක ගිණුම් 290ක් යටතේ ලැබිණ. මෙම බැඳුම්කර එක්සත් ජනපදය සඳහා සියයට 55ක ප්‍රමාණයක්, යුරෝපය සඳහා සියයට 29ක ප්‍රමාණයක් සහ ආසියාව සඳහා සියයට 16ක ප්‍රමාණයක් වශයෙන් විසිරී පැවතිණි. මෙය ආයෝජකයන් අනුව වර්ග කිරීමේ දී අරමුදල් කළමනාකරුවන් සඳහා සියයට 88ක්, බැංකු සඳහා සියයට 9ක් හා විශ්‍රාම/රක්ෂණ අරමුදල් සඳහා සියයට 3ක් වශයෙන් බෙදී යන ලදී.

ජාත්‍යන්තර බැඳුම්කර වෙළෙඳපොළේ විචල්‍යතාවන් පවතිද්දී වුව ද මෙම බැඳුම්කර නිකුතුවේ ප්‍රතිඵල තුළින් සනාථ වනුයේ ජාත්‍යන්තර ආයෝජකයන්ගේ ශ්‍රී ලංකාව කෙරෙහි පවතින විශ්වසනීයභාවයයි.

*Note:*

*This press release is not an offer of securities for sale in the United States. The securities referred to herein have not been and will not be registered under the U.S. Securities Act of 1933, as amended (the "Securities Act"), or any state securities laws of the United States, and may not be offered or sold in the United States absent registration or an applicable exemption from, or in a transaction not subject to, the registration requirements under the Securities Act and applicable state securities laws of the United States. Any public offering of securities to be made in the United States will be made by means of a prospectus that may be obtained from the issuer and that will contain detailed information about the issuer. Nothing in this press release shall constitute an offer to sell or the solicitation of an offer to buy securities in any jurisdiction in which such offer or sale would be unlawful. A rating is not a recommendation to buy, sell or hold the securities and may be subject to suspension, reduction or withdrawal at any time by the rating agency.*